සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**67 STE**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
**General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)**

**සංස්කෘත**
**சம்ஸ்கிருதம்**
**Sanskrit**

**පැය තුනයි**
**மூன்று மணித்தியாலம்**
***Three hours***

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

வினாப்பத்திரத்தை வாசித்து, வினாக்களைத் தெரிவுசெய்வதற்கும் விடை எழுதும்போது முன்னுரிமை வழங்கும் வினாக்களை ஒழுங்கமைத்துக் கொள்வதற்கும் மேலதிக வாசிப்பு நேரத்தைப் பயன்படுத்துக.

**Use additional reading time to go through the question paper, select the questions you will answer and decide which of them you will prioritise.**

විභාග අංකය / சுட்டெண் / **Index No.** ..............................................................

**උපදෙස් :**

- ✳ මෙම ප්‍රශ්න පත්‍රයට **එක් භාෂාවකින් පමණක්** පිළිතුරු සැපයිය යුතුයි.
- ✳ **පළමුවන** හා **දෙවන** ප්‍රශ්න අනිවාර්ය වේ. එක් ප්‍රශ්නයකට ලකුණු **20** බැගින් ලකුණු **40** කි.
- ✳ සෙසු ව්‍යුහගත ප්‍රශ්න **5** න්, **3** කට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **20** බැගින් මුළු ලකුණු **60** කි.
- ✳ **ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සැපයිය යුතුය.**

**அறிவுறுத்தல்கள் :**

- ✳ இவ்வினாத்தாளுக்குரிய விடைகளை **ஒரு மொழியில் மட்டுமே** எழுதுதல் வேண்டும்.
- ✳ **முதலாம், இரண்டாம்** வினாக்கள் கட்டாயமானவை. ஒரு வினாவிற்கு **20** புள்ளிகள் வீதம் மொத்தப் புள்ளிகள் **40** ஆகும்.
- ✳ ஏனைய கட்டமைப்பு வகை வினாக்கள் **5** இல் **3** இற்கு மாத்திரம் விடையளித்தல் வேண்டும். ஒரு வினாவுக்கு **20** புள்ளிகள் வீதம் மொத்தப் புள்ளிகள் **60** வழங்கப்படும்.
- ✳ **இவ்வினாத்தாளிலேயே விடையளித்தல் வேண்டும்.**

**Instructions :**

- ✳ *This question paper should be answered entirely in **one language only.***
- ✳ **First** and **second** questions are compulsory. Each question carries **20** marks and total marks is **40**.
- ✳ Only **3** out of the other **5** structured questions should be answered. Each question carries **20** marks. Total **60** marks.
- ✳ **Answers should be written on this paper itself.**

**For Examiner's Use Only**

| Question No. | Marks Awarded |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| Total | |

**Final Marks**

| | |
|---|---|
| In Numbers | |
| In Letters | |

**Code Numbers**

| | | |
|---|---|---|
| Marking Examiner | | |
| Marks Checked by | 1 | |
| | 2 | |
| Chief Examiner | | |

[ 2 වැනි පිටුව බලන්න. / பக். 2 ஐப் பார்க்க / *See page* 2

1. (a) නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
மிகச்சரியான விடையினைத் தெரிவுசெய்து அதன்கீழ் கோடிடுக.
Select the correct answer and underline it.

(i) केवलं **मूर्धजाक्षराणि**।

(A) ट ढ र ष ण (B) र श ड ष ण

(C) र ग ड द ण (D) र क ह ग ष

(ii) केवलं **संध्यक्षराणि**।

(A) ए अय् ओ अव् (B) अय् आय् अव् आव्

(C) ए ऐ ओ औ (D) ऐ औ आर् आल्

(iii) **सुरासुर** इति।

(A) व्यञ्जनसन्धिः। (B) विसर्गसन्धिः।

(C) प्रकृतिसन्धिः। (D) स्वरसन्धिः।

(iv) बालकानाम् इति।

(A) स्त्रीलिङ्ग षष्ठी विभक्ति बहुवचनम्।

(B) पुरुषलिङ्ग षष्ठी विभक्ति बहुवचनम्।

(C) नपुंसकलिङ्ग षष्ठी विभक्ति बहुवचनम्।

(D) द्विलिङ्ग षष्ठी विभक्ति बहुवचनम्।

(v) **धावामि** इति।

(A) लट् लकार परस्मैपद उत्तम पुरुष एकवचनम्।

(B) लिट् लकार परस्मैपद उत्तम पुरुष एकवचनम्।

(C) लङ् लकार परस्मैपद उत्तम पुरुष एकवचनम्

(D) लोट् लकार परस्मैपद उत्तम पुरुष एकवचनम्।

(vi) **देवः** इत्यस्य पदस्य पर्यायपदम्।

(A) मित्रः। (B) अमरः। (C) यमः। (D) वरुणः।

(vii) ✓**नी** लट् लकार परस्मैपद मध्यम पुरुष एकवचनम्।

(A) नयसि। (B) नय। (C) नयथ। (D) नयथः।

0232

(viii) **मेघदूतस्य** कर्ता।

(A) श्री कुमारदासः। (B) श्री हर्षदेवः।

(C) श्री जयदेवः। (D) श्री कालिदासः।

(ix) **नारायणशर्मणः** कृतिः।

(A) हितोपदेशः। (B) पञ्चतन्त्रम्।

(C) गीतगोविन्दम्। (D) व्यासकारः।

(x) **पञ्चदश**।

(A) १० (B) १५ (C) २५ (D) ३५

(ලකුණු 10 යි)/(10 புள்ளிகள்)/(10 *marks*)

(b) පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.
பின்வரும் வினாக்களுக்கு சுருக்கமான விடை தருக.
Give short answers to the following questions.

(i) හිතෝපදේශයේ පරිච්ඡේද **දෙකක්** නම් කරන්න.
ஹிதோபதேசத்தின் **இரு** அத்தியாயங்களைப் பெயரிடுக.
Name **two** chapters of *Hitopadeśa.*

..........................................................................................................

(ii) පඤ්චතන්ත්‍රයේ කතුවරයා කවුද?
பஞ்சதந்திரத்தின் ஆசிரியர் யார்?
Who is the author of *Pañcatantra?*

..........................................................................................................

(iii) ව්‍යාසකාරයේ ශ්ලෝක උපුටා ගන්නා ලද්දේ කුමන පුරාණ ග්‍රන්ථයෙන් ද?
வயாசகார சுலோகம் எந்தப் புராணத்தில் மேற்கோள்காட்டப்பட்டுள்ளது?
From which purāna text the *ślokās* of *vyāsakāra* are quoted?

..........................................................................................................

(iv) හිතෝපදේශය රචනා කරන ලද්දේ කාගේ පුතුන් සඳහා ද?
ஹிதோபதேசம் யாருடைய பிள்ளைகளுக்காக தொகுக்கப்பட்டது?
For whose sons *Hitopadeśa* was composed?

..........................................................................................................

(v) අභිඥානශාකුන්තලයේ කථා නායකයා කවුද?
அபிஞானசாகுந்தலத்தின் நாயகன் யார்?
Who is the hero of *Abhignānaśākuntalam?*

..........................................................................................................

(vi) මේඝදූතයෙහි සඳහන් පණිවුඩය කා විසින් කාහට යවන ලද්දක් ද?
மேகதூத செய்தி யாரினால் யாருக்கு அனுப்பப்பட்டது?
Who sent the message of *Meghadūta* and to whom?

..........................................................................................................

(vii) **दुर्जनसंसर्गं त्यज ।** මෙහි අර්ථය කුමක් ද?
**दुर्जनसंसर्गं त्यज ।** இதன் கருத்து என்ன?
**दुर्जनसंसर्गं त्यज ।** What is the meaning of this?

.................................................................................................................................

(viii) පහත ශ්ලෝක පාදය සම්පූර්ණ කරන්න.
இச்சுலோகத்தின் வரியை பூரணப்படுத்துக.
Complete the following poem line.

**अव्यापारेषु व्यापारं -------- ।**

.................................................................................................................................

(ix) පහත සඳහන් වචනවල තේරුම් ලියන්න.
பின்வரும் சொற்களின் கருத்துக்களை எழுதுக.
Write the meaning of the following words.

**वदनम् ।** **शृगालः ।** **कपोतः ।** **शुक्रवारः ।**

.................................................................................................................................

(x) පහත සඳහන් වාක්‍යයේ තේරුම කුමක් ද?
பின்வரும் வாக்கியத்தின் கருத்து என்ன?
What is the meaning of the sentence stated below?

**अहं राधिका ।**

.................................................................................................................................

(ලකුණු 10 යි)/(10 புள்ளிகள்)/(10 marks)

**2.** (a) පහත දැක්වෙන වාක්‍ය **සිංහලයට** පරිවර්තනය කරන්න.
பின்வரும் வாக்கியங்களைத் **தமிழில்** மொழிபெயர்க்குக.
Translate the following sentences into **English.**

(i) यथा चित्तं तथा वाचः । ..............................................

(ii) विद्यासमो बन्धुः नास्ति । ..............................................

(iii) गजः वने वसति । ..............................................

(iv) वयं दूरदर्शनं पश्यामः । ..............................................

(v) जननी दारकं लालयते । ..............................................

(ලකුණු 10 යි)/(10 புள்ளிகள்)/(10 marks)

(b) පහත දැක්වෙන වාක්‍ය **සංස්කෘතයට පරිවර්තනය** කොට, **දේවනාගරී අක්ෂරයෙන්** ලියන්න.
பின்வரும் வாக்கியங்களைச் **சம்ஸ்கிருதத்தில் மொழிபெயர்த்து அவற்றை தேவநாகரீ எழுத்தில் எழுதுக.**
Translate the following sentences into **Sanskrit and write in *Devanāgarī* script.**

(i) ඔබේ නම කුමක් ද?
உனது பெயர் என்ன?
What is your name?

.................................................................................................................................

[ 5 වැනි පිටුව බලන්න. / பக். 5 ஐப் பார்க்க / *See page* 5

0232

(ii) ඔහු ගුරුවරයෙක්.
அவர் ஓர் ஆசிரியர்.
He is a teacher.

..........................................................................................................................

(iii) අපි දෙදෙනා ගීයක් ගයමු.
நாமிருவரும் ஒரு பாடலைப் பாடுவோம்.
We two shall sing a song.

..........................................................................................................................

(iv) ශිෂ්‍යයෝ පාසලට ගියහ.
மாணவர்கள் பாடசாலைக்குச் சென்றனர்.
Students went to the school.

..........................................................................................................................

(v) මේ විලේ මල් ඇත.
இந்தக் குளத்தில் பூக்கள் இருக்கின்றன.
There are flowers in this pond.

..........................................................................................................................

(ලකුණු 10 යි)/(10 புள்ளிகள்)/(10 marks)

**3.** (a) පහත සඳහන් ආදර්ශ පද රටාව දෙස බලා, හිස්තැනට **ගැළපෙන වචනය** ලියන්න.
கீழே உதாரணமாகத் தரப்பட்டுள்ள சொற்களின் கோலத்தை அவதானித்து, வெற்றிடங்களுக்குப் **பொருத்தமான சொற்களை** எழுதுக.
Fill in the blanks **with suitable words** in accordance to the example word pattern mentioned below.

| नरः | नरौ | नराः |
|---|---|---|
| देवः | .............................. | .............................. |
| सा | ते | .............................. |
| .............................. | .............................. | अजैः |

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

(b) अलम् । आदाय । अमरणीय । पक्तुम् । नागरिक ।

ඉහත වචන භාවිත කරමින් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.
மேலுள்ள சொற்களைப் பயன்படுத்தி பின்வரும் அட்டவணையைப் பூரணப்படுத்துக.
Complete the following table using words given above.

| कृदन्त | तुमन्त | तद्धित | निपात | पूर्वक्रिया |
|---|---|---|---|---|
| ................ | ................ | ................ | ................ | ................ |

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

[ 6 වැනි පිටුව බලන්න. / பக். 6 ஐப் பார்க்க / *See page* 6

(c) පහත දැක්වෙන පදවල **ඒකවචන** රූප ලියන්න.
பின்வரும் சொற்களின் **ஒருமை** வடிவத்தை எழுதுக.
Write the **singular** forms of the following words.

बालकैः …………… लतासु …………… वनानि ……………

गायथ …………… अपठन् ……………

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

(d) පහත දැක්වෙන පදවල **ශබ්ද මූලය හෝ ධාතු මූලය** ලියන්න.
பின்வரும் சொற்களின் **பெயரடியை அல்லது வினையடியை** எழுதுக.
Write the **stem or root** of the following words.

वयम् । …………… पुस्तकालये । …………… आगच्छति । ……………

चोरयति । …………… लिखति । ……………

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

**4.** (a) පහත සඳහන් **නාම වරනැගීම** සම්පූර්ණ කරන්න.
பின்வரும் **பெயர்களின் வேற்றுமை வடிவங்களைப்** பூரணப்படுத்துக.
Complete the following **noun declensions**.

| | एकवचनम् | द्विवचनम् | बहुवचनम् |
|---|---|---|---|
| प्रथमा | ……………… | इमे | इमाः |
| द्वितीया | शालाम् | शाले | ……………… |
| चतुर्थी | गजाय | ……………… | गजेभ्यः |
| पञ्चमी | ……………… | वानराभ्याम् | ……………… |
| सप्तमी | ……………… | पुष्पयोः | पुष्पेषु |

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

(b) පහත සඳහන් **ආඛ්‍යාත වරනැගීම** සම්පූර්ණ කරන්න.
பின்வரும் **வினைச்சொல் வேற்றுமை வடிவங்களைப்** பூரணப்படுத்துக.
Complete the following **verbal declensions**.

| | एकवचनम् | द्विवचनम् | बहुवचनम् |
|---|---|---|---|
| प्रथमपुरुष | ……………… | अवसताम् | ……………… |
| मध्यमपुरुष | विहरषि | ……………… | विहरथ |
| उत्तमपुरुष | पठानि | ……………… | ……………… |

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

[ 7 වැනි පිටුව බලන්න. / பக். 7 ஐப் பார்க்க / *See page* 7

(c) වරහන් තුළ ඇති වචන සුදුසු පරිදි යොදා හිස්තැන් පුරවන්න.
அடைப்புக்குறிக்குள் தரப்பட்டுள்ள சொற்களைப் பொருத்தமான விதத்தில் பயன்படுத்தி வெற்றிடங்களை நிரப்புக.
Fill in the blanks with suitable words given in the brackets.

(सूर्यस्य - चण्डः - तदा - यदा - पद्मानि - नाशयति - मृदु - सूर्यस्य - दिशि - अस्तं)

सूर्यः पूर्वस्यां .............. उदेति। तस्मिन् समये .............. प्रकाशः .............. कोमलश्च भवति।

तथापि सूर्योऽन्धकारं ..............। प्राणिनः प्रबोधयति। .............. विकाशयति च। .............. सूर्यः

नभसि मध्यम् आरोहति .............. मध्याह्नः इति वदन्ति। तदा सूर्यस्य प्रकाशः .............. भवति। ततः

क्रमेण .............. गच्छति। अस्तं गच्छन् सूर्यः पुनः अपि मृदुकोमलश्च भवति। जीवितमपि..............

समानमिति वदन्ति।

(ලකුණු 10 යි)/(10 புள்ளிகள்)/(10 marks)

5. (a) පහත දැක්වෙන ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
பின்வரும் பந்தியை அடிப்படையாகக் கொண்டு கேட்கப்பட்டுள்ள வினாக்களுக்கு விடை தருக.
Answer the questions given below based on the following passage.

अस्ति मगधदेशे चम्पकवती नामारण्यानी। तस्यां चिरान्महता स्नेहेन मृगकाकौ निवसतः। स च मृगः स्वेच्छया भ्राम्यन् हृष्टपृष्टाङ्गः केनचिच्छृगालेनावलोकितः। तं दृष्ट्वा शृगालोऽचिन्तयत् - आः, कथमेतन्मांसं सुललितं भक्षयामि। भवतु! विश्वासं तावदुत्पादयामि। इत्यालोच्योपसृत्याब्रवीत् – मित्र, कुशलं ते। मृगेणोक्तम्। कस्त्वम्। स ब्रूते - क्षुद्रबुद्धिर्नामा जम्बुकोऽहम्। अत्रारण्ये बन्धुहीनो मृतवदेकाकी वसामि। इदानीं त्वं मित्रमासाद्य पुनः सबन्धुर्जीवलोकं प्रविष्टोऽस्मि। अधुना तवानुचरेण मया सर्वथा भवितव्यम्। मृगेणोक्तम् - एवमस्तु। ततः पश्चादस्तं गते सवितरि भगवति मरीचिमालिनि तौ मृगस्य वासभूमिं गतौ। तत्र चम्पकवृक्षशाखायां सुबुद्धिर्नामा काको मृगस्य चिरमित्रं निवसति। तौ दृष्ट्वा काकोऽवदत् - सखे चित्राङ्ग, कोऽयं द्वितीयः। मृगो ब्रूते - जम्बुकोऽयम्॥

(i) පෘෂ්ටිමත් මුවා දුටු හිවලා කුමක් සිතුවේ ද?
பருத்த மானைப் பார்த்த பின்பு நரியின் எண்ணம் என்ன?
What was the thought of Jackal after seeing the well grown deer?

.......................................................................................................................

(ii) "ඔබ කවුදැයි" විමසුවේ කවුද?
"யார் நீ" என்று யார் கேட்டது?
Who asked "who you are"?

..........................................................................................................................

(iii) ඉර බැස ගිය කල්හි මුවාගේ වාසභූමියට ගියෝ කවරහු ද?
சூரிய அஸ்தமனத்தின் பின்பு மானின் வசிப்பிடத்துக்கு சென்றவர்கள் யார்?
who went to the living place of deer after sunset?

..........................................................................................................................

(iv) මුවාගේ නම කුමක් ද?
மானின் பெயர் என்ன?
What is the name of deer?

..........................................................................................................................

(v) මුවාගේ මිතුරා කවුද?
மானின் நண்பன் யார்?
Who is the friend of deer?

..........................................................................................................................

(ලකුණු 10 යි)/(10 புள்ளிகள்)/(10 marks)

(b) ඉහත ඡේදයේ දැක්වෙන **විසර්ග සන්ධි පද දෙකක්, ස්වර සන්ධි පද දෙකක් හා ව්‍යඤ්ජන සන්ධි පද එකක්** තෝරා විසන්ධි කොට ලියන්න.
மேலே தரப்பட்டுள்ள பந்தியிலுள்ள **இரண்டு விஸர்க்க சந்திகளையும், இரண்டு உயிரீற்று சந்திகளையும், ஒரு மெய்யீற்று சந்திகளையும்** தெரிவுசெய்து அவற்றைச் சந்தி பிரித்து எழுதுக.
Choose **two *visarga*** *sandhis*, **two *svara*** (vowel) *sandhis* and **one *vyañjana*** (consonant) *sandhi* from the above passage, disjoin them and write.

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

3. ..........................................................................................................................

4. ..........................................................................................................................

5. ..........................................................................................................................

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

[ 9 වැනි පිටුව බලන්න. / பக். 9 ஐப் பார்க்க / *See page* 9

(c) ඉහත ඡේදයෙන් ප්‍රථමා විභක්ති පද **පහක්** තෝරා ඒවායේ ශබ්ද ප්‍රකෘති වෙන වෙන ම ලියන්න.
மேலே தரப்பட்டுள்ள பந்தியில் **ஐந்து** முதலாம் வேற்றுமை சொற்களைத் தெரிவுசெய்து அவற்றின் பெயரடிகளை வெவ்வேறாக எழுதுக.
Choose **five** words of nominative case from above passage and write the stem of each separately.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................
4. ..........................................................................................
5. ..........................................................................................

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

**6.** (a) ශතක ග්‍රන්ථ **තුනක්** ලියන්න.
சதக நூல்கள் **மூன்றின்** பெயர்களை எழுதுக.
Write the names of **three** *Śataka* texts.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................

(ලකුණු 03 යි)/(03 புள்ளிகள்)/(03 marks)

(b) උපදේශ ශ්ලෝකයක් ලියා එහි තේරුම ලියන්න.
உபதேச சுலோகம் ஒன்றையும் அதன் கருத்தையும் எழுதுக.
Write **one** didactic *śloka* and the meaning of it.

..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................

(ලකුණු 04 යි)/(04 புள்ளிகள்)/(04 marks)

(c) ශතක ග්‍රන්ථ පිළිබඳ කෙටි සටහනක් ලියන්න.
சதக நூல்கள் பற்றி சிறுகுறிப்பொன்றை எழுதுக.
Write a short note on *Śataka texts*.

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

(d) මහාකවි කාලිදාස පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
மஹாகவி காளிதாசர் பற்றிய சிறு அறிமுகமொன்றை எழுதுக.
Write a brief introduction of *Mahākavi Kālidāsa*.

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................


.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

(ලකුණු 08 යි)/(08 புள்ளிகள்)/(08 marks)

7.




(a) ඉහත චිත්‍රය ඇසුරෙන් **වචන තුනකට නොඅඩු සංස්කෘත වාක්‍ය පහක් දේවනාගරී** අකුරෙන් ලියන්න.
(එක ම වචනය දෙවරකට වඩා භාවිත **නොකළ යුතු ය.**)
மேலேயுள்ள படத்தைப் பயன்படுத்தி ஒவ்வொன்றும் **மூன்று சொற்களுக்குக் குறையாத ஐந்து சம்ஸ்கிருத வாக்கியங்களை தேவநாகரீ** எழுத்தில் எழுதுக. (ஒரு சொல்லை இரண்டு தடவைகளுக்கு மேல் **பயன்படுத்தக்கூடாது.**)
With reference to the above picture, write **five** sentences using **not less than three words** each in the ***Devanāgarī*** Script. (Same word **cannot be used** more than twice.)

1. ................................................................................................................

2. ................................................................................................................

3. ................................................................................................................

4. ................................................................................................................

5. ................................................................................................................

(ලකුණු 10 යි)/(10 புள்ளிகள்)/(10 marks)

(b) පහත සඳහන් ශ්ලෝකය **පද වෙන් කොට** නැවත ලියන්න.
பின்வரும் சுலோகத்தை **தனித்தனிச் சொற்களாகப் பிரித்து** மீண்டும் எழுதுக.
Rewrite the following *śloka* putting **each word separately**.

अरक्षितं तिष्ठति दैवरक्षितं सुरक्षितं दैवहतं विनश्यति ।
जीवत्यनाथोऽपि वने विसर्जितः कृतप्रयत्नोऽपि गृहे विनश्यति ॥

..........................................................................................................................

..........................................................................................................................

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

(c) ස්වර සන්ධිය හඳුන්වා උදාහරණ **හතරක්** ලියන්න.
உயிர்ப்புணர்ச்சியை அறிமுகப்படுத்தி, அதற்கான **நான்கு** உதாரணங்களையும் எழுதுக.
Introduce the svara (Vowel) sandhi and write **four** examples.

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

***

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2023 (2024)

# ලකුණු දීමේ පටිපාටිය

## 67 - සංස්කෘත - ६७ संस्कृत

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

# 67 - සංස්කෘත - ६७ संस्कृत

## <u>අවසාන ලකුණු ගණනය කිරීම</u>

### <u>I පත්‍රය</u>

ප්‍රශ්න අංක 01 - 40 (01 X 40) ලකුණු 40

### <u>II පත්‍රය</u>

I කොටස

1. ප්‍රශ්නය ලකුණු 20

II කොටස

| | | |
|---|---|---|
| 2. ප්‍රශ්නය | ලකුණු 10 | ප්‍රශ්න 04කට ලකුණු 40 |
| 3. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 4. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 5. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 6. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 7. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 8. ප්‍රශ්නය | ලකුණු 10 | |

I පත්‍රයට ලකුණු 40

II පත්‍රයට ලකුණු <u>60</u>

අවසාන ලකුණු <u>100</u>

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී meyeE,s b,lalfuka ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..........................................................
..........................................................
.......................................................... √ △ $\frac{4}{5}$

(ii) ..........................................................
..........................................................
.......................................................... √ △ $\frac{3}{5}$

(iii) ..........................................................
..........................................................
.......................................................... √ △ $\frac{3}{5}$

(03) එකතුව ➡ □ $\frac{10}{15}$

බහුවරණ උත්තරපත්‍ර :

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.
**VI. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

ලකුණු ලැයිස්තු සකස් කිරීම :

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.
II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.
III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**
IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.
V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**
VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- (I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***

# 67 - සංස්කෘත

## ලකුණු දීමේ පටිපාටිය

**ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථ**

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය හා මූලික පිරිවෙන් අවසාන විභාගය යනු සංස්කෘත විෂයය හදාරන ශිෂ්‍යයන් පෙනී සිටින ජාතික මට්ටමේ ප්‍රාථමික විභාග දෙකකි. එහෙයින් මෙහි දී සංස්කෘත භාෂාව පිළිබඳ මූලික දැනුමක් පමණක් අපේක්ෂා කැරේ. දේවනාගරී අක්ෂර නිවැරදි ව භාවිත කිරීම, (සංයුක්තාක්ෂර ඇතුළු ව) විභක්ති ප්‍රයෝග භාවිතය, සරල සංස්කෘත ඡේදයක් දළ වශයෙන් තේරුම් ගැනීම, නිවැරදි ව හා ව්‍යාකරණානුකූල ව පරිවර්තනය කිරීම, සරල සන්ධි තේරුම් ගැනීම, කෘදන්ත, ශබ්දප්‍රකෘති හඳුනා ගැනීම, ශබ්ද හා ධාතු වරනැඟීම, සරල සංස්කෘත වාක්‍ය නිර්මාණය කිරීම යන ශක්‍යතා පිළිබඳ ඇගයීමත් කෙටි ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ හැකියාව මැන බැලීමත් මෙම ප්‍රශ්න පත්‍රයෙන් අපේක්ෂිත ය.

පිළිතුරු පත්‍ර ලකුණු කිරීම සඳහා උපදෙස්

මෙවර ආදර්ශ පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීමේ දී දේවනාගරී අක්ෂර භාවිතය පිළිබඳ ශිෂ්‍යයන්ගේ කිසියම් ප්‍රගතියක් දක්නට ලැබුණ ද පිළිතුරු ඇගයීමේ දී දේවනාගරී අක්ෂර භාවිතය සම්බන්ධයෙන් දක්නට ලැබෙන අඩුපාඩු ගැන තදින් ක්‍රියා නොකළ යුතු ය. දේවනාගරී අක්ෂර භාවිත කරන ලෙස උපදෙස් දී නැති විට, පිළිතුරු ලිවීමේ දී දේවනාගරී අක්ෂර වෙනුවට සිංහල අක්ෂර නිවැරදි ලෙස භාවිත කොට ඇත්නම් සම්පූර්ණ ලකුණු දෙන්න.

**67 - සංස්කෘත**

ප්‍රශ්න අංක 01 සහ 02 ඇතුළු ව ප්‍රශ්න 05 ට පමණක් පිළිතුරු සපයා තිබිය යුතු ය.

**01. වන ප්‍රශ්නය**

මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත ය. පළමු කොටසින් බහුවරණ ක්‍රමයට සංස්කෘත ව්‍යාකරණය හා සාහිත්‍ය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම අරමුණු වන අතර දෙවන කොටසින් කෙටි පිළිතුරු සැපයීමේ ශක්‍යතාව පරීක්ෂා කිරීම අරමුණ වේ. මෙම ප්‍රශ්නයට හිමි මුළු ලකුණු සංඛ්‍යාව 20කි. මෙහි කොටස් දෙකේ ම එක පිළිතුරකට ලකුණ බැගින් දෙන්න. මෙය අනිවාර්ය ප්‍රශ්නයකි.

**02 වන ප්‍රශ්නය**

සරල සංස්කෘත වාක්‍ය සිංහලයටත් සරල සිංහල වාක්‍ය සංස්කෘතයටත් පරිවර්තනය කිරීමේ හැකියාව පිරික්සීම මෙහි අරමුණයි. මෙහි දී පිළිතුරුවල උක්තාඛ්‍යාත සම්බන්ධය ගැන සැලකිලිමත් විය යුතු ය. එක ම අදහස නිවැරදි ව විවිධාකාරයෙන් ප්‍රකාශයට පත් වී තිබිය හැකි ය. ඒ නිසා අදහස නිවැරදි ව ප්‍රකාශ වී ඇත් නම් සාපේක්ෂ ව බලා ලකුණු දෙන්න.

මෙම ප්‍රශ්නයට හිමි මුළු ලකුණු සංඛ්‍යාව 20කි. එබැවින් එක් වාක්‍යයකට ලකුණු 02කි. මෙම ප්‍රශ්නයේ දෙවන කොටස සඳහා දේවනාගරී අක්ෂර අනිවාර්ය කොට ඇති බැවින් සිංහල අකුරෙන් නිවැරදි පිළිතුරු ලියා ඇත්නම් එක් වාක්‍යයකට නියම කොට ඇති ලකුණුවලින් 01 බැගින් අඩු කරන්න. මෙය ද අනිවාර්ය ප්‍රශ්නය කි.

**වරණීය ප්‍රශ්න අංක 03,04,05,06 හා 07**

**03. වන ප්‍රශ්නය**

මෙම ප්‍රශ්නයෙන් සංස්කෘත භාෂාව භාවිතයේ දී අත්‍යවශ්‍ය භාෂා ප්‍රයෝග පිළිබඳ දැනුම පිරික්ෂා බැලීම අරමුණ වේ. එබැවින් ප්‍රශ්නය කොටස් හතරකින් සමන්විත ය. කොටස් හතරට ම සම ලකුණු හිමි වේ. එක් පිළිතුරකට 01 ලකුණ බැගින් දෙන්න. මුළු ලකුණු 20යි.

**04. වන ප්‍රශ්නය**

මෙම ප්‍රශ්නය නාම වරනැගීම හා ආඛ්‍යාත වරනැගීම යන කොටස් දෙකෙන් හා ඡේදයක හිස්තැන් පිරවීම යනුවෙන් කොටසකින් ද යුක්ත ය. නාම වරනැගීම යටතේ විවිධ නාම පද විභක්තීන්හි සුදුසු පරිදි යොදා ගැනීමේ හැකියාවත් ක්‍රියාපද සාධනයේ දී විවිධ ධාතු පුරුෂත්‍රයෙහි ලකාරවල යෙදීමේ හැකියාවත් මැන බැලීමත් වරනැගීමේ දි විභක්ති ප්‍රත්‍ය වනපොත් කිරීම අවශ්‍ය වන්නාක් මෙන් ම ශබ්ද රූප තනා ගැනීමේ දී ස්මරණය අවශ්‍යවන හෙයින් එම වාචෝද්ගත කිරීම අවබෝධයෙන් කළයුතු නිසා ඒ සඳහා ශිෂ්‍යයා යොමු කිරීම මෙහි අපේක්ෂාව වේ. මෙහි තෙවන කොටසින් වාක්‍යයක් නිසිපරිදි තේරුම් ගෙන හිස්තැන් සම්පූර්ණ කිරීමෙන් වචන නියමිත ස්ථානයෙහි යෙදීමේ හැකියාව පරීක්ෂා කෙරේ. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 20කි. අපේක්ෂිත පිළිතුරු සංඛ්‍යාව ද 20කි. එහෙයින් නිවැරදි එක් පිළිතුරකට 01 ලකුණ බැගිනි.

**05. වන ප්‍රශ්නය**

මෙම ප්‍රශ්නයෙන් සංස්කෘත සරල ඡේදයක් කියවා අවබෝධ කර ගැනීමේ ද සන්ධි පද විසන්ධි කිරීමේ ද ශබ්ද ප්‍රකෘති පද හඳුනා ගැනීමේ ද හැකියාව මැන බැලීම අපේක්ෂාවයි. ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 20කි. පළමු කොටසේ පිළිතුරකට ලකුණු 02 බැගින් ද දෙවන සහ තුන් වන කොටසේ පිළිතුරකට ලකුණු 01 බැගින් ද දෙන්න.

**06. වන ප්‍රශ්නය**

මෙම ප්‍රශ්නය ද කොටස් හතරකින් සමන්විත වේ. එක කොටසින් ග්‍රන්ථ වින්‍යාසයත් දෙක කොටසින් සාහිත්‍යාත්මක ශ්ලෝක ස්මරණයත් එහි අර්ථාවබෝධයත් තෙවන කොටසින් සංශ්ලේෂණයත් විශ්ලේෂණයත් හතරවන කොටසින් විභක්ති හා නාමපද සාධනයත් මැනීම අපේක්ෂාව යි. ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 20කි. i කොටස ලකුණු 03යි. ii. කොටස ලකුණු 04යි. iii. කොටස ලකුණු 05යි. iv. කොටස ලකුණු 08යි.

**07. වන ප්‍රශ්නය**

මෙම ප්‍රශ්නයේ පළමු කොටසින් ශිෂ්‍යයාගේ නිරීක්ෂණ, ප්‍රකාශන හා නිර්මාණ ශක්තිය පරීක්ෂා කිරීම, දෙවන කොටසින් පද වෙන් කොට ලිවීමේ හැකියාව, හා තෙවන කොටසින් නියමිත ග්‍රන්ථාධ්‍යයන පරීක්ෂා කිරීම අපේක්ෂාව යි. වචන තුනක් වත් අඩංගු වී ඇති නිවැරදි එක් වාක්‍යයකට ලකුණු 02යි. වචන තුනකට අඩු එහෙත් නිවැරදි වාක්‍යයට සාපේක්ෂ ව බලා ලකුණු දෙන්න. සම්පූර්ණ ලකුණු 10යි. දෙවන කොටසේ පද නිවැරදි ව වෙන් කොට ඇති සාපේක්ෂව බලා ලකුණු දෙන්න. ලකුණු 05යි. තෙවන කොටසට ලකුණු 05යි. ව්‍යඤ්ජන සන්ධිය හඳුන්වා ප්‍රභේද තුනක් ලියා තිබිය යුතු ය.

**ලකුණු දීමේ පටිපාටිය**

**පිළිතුරු පත්‍රයට හිමි මුළු ලකුණු සංඛ්‍යාව 100කි.**

01. වන ප්‍රශ්නයට ලකුණු (a) 01x10+ (b) 01x10 =20කි.

02. වන ප්‍රශ්නයට ලකුණු (a) 02x05+ (b) 02x05 =20කි.

03. වන ප්‍රශ්නයට ලකුණු (05+05+05+05) =20කි.

04. වන ප්‍රශ්නයට ලකුණු (05+05+10) =20කි.

05. වන ප්‍රශ්නයට ලකුණු (02x05+05+05) =20කි.

06. වන ප්‍රශ්නයට ලකුණු (03+04+05+08) =20කි.

07. වන ප්‍රශ්නයට ලකුණු (02x05+05+05) =20කි.

| | | |
|---|---|---|
| 01 වන සහ 02 වන අනිවාර්ය ප්‍රශ්න දෙකට | **(02x20)** | ලකුණු 40යි. |
| වරණීය ප්‍රශ්න තුනට | **(03x20)** | ලකුණු 60යි. |
| | මුළු | ලකුණු 100යි. |

# ආදර්ශ පිළිතුරු පත්‍රය

01. (a) නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න. (ලකුණු 10 යි)

மிகச்சரியான விடையினைத் தெரிவுசெய்து அதன்கீழ் கோடிடுக

Select the correct answer and underline it.

(i) केवलं **मूर्धजाक्षराणि** ।

(A) ट ढ र ष ण (B) र श ड ष ण

(C) र ग ड द ण (D) र क ह ग ष

(ii) केवलं **संध्यक्षराणि** ।

(A) ए अय् ओ अव् (B) अय् आय् अव् आव्

(C) ए ऐ ओ औ (D) ऐ औ आर् आल्

(iii) **सुरासुर** इति ।

(A) व्यञ्जनसन्धिः । (B) विसर्गसन्धिः ।

(C) प्रकृतिसन्धिः । (D) स्वरसन्धिः ।

(iv) बालकानाम् इति ।

(A) स्त्रीलिङ्ग षष्ठी विभक्ति बहुवचनम् ।

(B) पुरुषलिङ्ग षष्ठी विभक्ति बहुवचनम् ।

(C) नपुंसकलिङ्ग षष्ठी विभक्ति बहुवचनम् ।

(D) द्विलिङ्ग षष्ठी विभक्ति बहुवचनम् ।

(v) **धावामि** इति ।

(A) लट् लकार परस्मैपद उत्तम पुरुष एकवचनम् ।

(B) लिट् लकार परस्मैपद उत्तम पुरुष एकवचनम् ।

(C) लङ् लकार परस्मैपद उत्तम पुरुष एकवचनम्

(D) लोट् लकार परस्मैपद उत्तम पुरुष एकवचनम् ।

(vi) **देवः** इत्यस्य पदस्य पर्यायपदम् ।

(A) मित्रः । (B) अमरः । (C) यमः । (D) वरुणः ।

(vii) ✓ **नी** लट् लकार परस्मैपद मध्यम पुरुष एकवचनम् ।

(A) नयसि । (B) नय । (C) नयथ । (D) नयथः ।

(viii) **मेघदूतस्य** कर्ता ।

(A) श्री कुमारदासः। (B) श्री हर्षदेवः।

(C) श्री जयदेवः। (D) श्री कालिदासः।

(ix) **नारायणशर्मणः कृतिः।**

(A) हितोपदेशः। (B) पञ्चतन्त्रम्।

(C) गीतगिविन्दम्। (D) व्यासकारः।

(x) **पञ्चदश।**

(A) १० (B) १५ (C) २५ (D) ३५

ආදර්ශ පිළිතුරු

(i) **(A)** ट ढ र ष ण।

(ii) **(C)** ए ऐ ओ औ।

(iii) **(D)** स्वरसन्धिः।

(iv) **(B)** पुरुषलिङ्ग षष्ठी विभक्ति बहुवचनम्।

(v) **(A)** लट् लकार परस्मैपद उत्तम पुरुष एकवचनम्।

(vi) **(B)** अमरः।

(vii) **(A)** नयसि ।

(viii) **(D)** श्री कालिदासः।

(ix) **(A)** हितोपदेशः।

(x) **(B)** १५

**(එක නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් දෙන්න.)**

(b) පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. (ලකුණු 10යි)

பின்வரும் வினாக்களுக்கு சுரக்கமான விடை தருக

Give short answers to the following questions.

(i) හිතෝපදේශයේ පරිච්ඡේද දෙකක් නම් ලියන්න / கிதோபதேசத்தில் இரு அத்தியாயங்களைப் பெயரிடுக /Name two chapters of Hitopadessa

(ii) පඤ්චතන්ත්‍රයේ කතුවරයා කවු ද./பஞ்சதந்திரத்தின் ஆசிரியர் யார்?∴Who the author of Pancatantra?

(iii) ව්‍යාසකාරයේ ශ්ලෝක උපුටා ගන්නා ලද්දේ කුමන පුරාණ ග්‍රන්ථයෙන් ද

(iv) හිතෝපදේශය රචනා කරන ලද්දේ කාගේ පුතුන්ට සඳහා ද

(v) අභිඥානශාකුන්තලයේ කථා නායකා කවු ද

(vi) මේඝදූතයෙහි සඳහන් පණිවුඩය කා විසින් කාහට යවන ලද්දක් ද

(vii) **दुर्जनसंसर्गं त्यज।** මෙහි අර්ථය කුමක් ද?

(viii) පහත ශ්ලෝක පාදය සම්පූර්ණ කරන්න.

**अव्यापारेषु व्यापारं ---------।**

(ix) **वदनम्।  शृगालः।  कपोतः।  शुक्रवारः।** මෙම වචනවල අර්ථ ලියන්න.

(x) **अहं राधिका।** මෙම වාක්‍යයේ තේරුම කුමක් ද?

ආදර්ශ පිළිතුරු

(i) මිත්‍රලාභ, සුහෘද්භේද, විග්‍රහ, සන්ධි,

(ii) විෂ්ණුශර්මන්

(iii) ගරුඩ පුරාණයෙන්

(iv) සුදර්ශන රජතුමාගේ

(v) දුෂ්‍යන්ත

(vi) යක්ෂයකු විසින් සිය ප්‍රියාවියට (බිරිඳට)

(vii) දුර්ජන සම්බන්ධය අතහරින්න.

(viii) **अव्यापारेषु व्यापारं यो नरः कर्तुमिच्छति।**

(ix) මුහුණ, නරියා, පරවියා, සිකුරාදා

(x) මම රාධිකා.

**(එක නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් දෙන්න.)**

02. (a) පහත දැක්වෙන වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න. (ලකුණු 10යි)

பின்வரும் வாக்கியங்களைத் தமிழில் மொழிபெயர்க்குக

Translate the following sentences into English.

(i) **यथा चित्तं तथा वाचः।**

(ii) **विद्यासमो बन्धुः नास्ति।**

(iii) **गजः वने वसति।**

(iv) **वयं दूरदर्शनं पश्यामः।**

(v) **जननी दारकं लालयते।**

ආදර්ශ පිළිතුරු

(i) සිත යම්සේ ද වචනය ද එසේ ය.

(ii) විද්‍යාව හා සමාන නෑයෙක් නැත.

(iii) අලියා වනයෙහි වාසය කරයි.

(iv) අපි රූපවාහිනිය නරඹමු.

(v) මව දරුවා නලවයි.

**(එක නිවැරදි පිළිතුරකට ලකුණු 02 බැගින් දෙන්න.)**

(b) පහත දැක්වෙන වාක්‍ය සංස්කෘතයට පරිවර්තනය කොට දේවනාගරී අක්ෂරයෙන් ලියන්න (ලකුණු 10යි)
பின்வரும் வாக்கியங்களைச் சம்ஸ்கிருதத்தில் மொழிபெயர்க்குக
Translate the following sentences into Sanskrit.

(i) ඔබේ නම කුමක් ද?/ உனது பெயர் என்ன? /What is your name?

(ii) ඔහු ගුරුවරයෙක්./ அவர் ஓர் ஆசிரியர்;/He is a teacher.

(iii) අපි දෙදෙනා ගීයක් ගයමු./ நாமிருவரும் ஒரு பாடலைப்பாடுகிறோம் / We two sing a song.

(iv) ශිෂ්‍යයෝ පාලසට ගියහ./ மாணவர்கள் பாடசாலைக்குச் சென்றனர். / Students went to the school.

(v) මේ විලේ මල් ඇත. / இந்தக்குளத்தில் பூக்கள் இருக்கின்றன. / There are flowers in this pond.

ආදර්ශ පිළිතුරු

(i) तव/ ते/ भवतः/ भवत्याः/ नाम किम्।

(ii) सः गुरुः।

(iii) आवां गीतं गायावः।

(iv) छात्राः शिष्याः पाठशालाम् अगच्छन्।

(v) अस्मिन् तडागे कुसुमानि सन्ति।

(එක නිවැරදි පිළිතුරකට ලකුණු 02 බැගින් දෙන්න.)

03. (a) පහත සඳහන් ආදර්ශ පද රටාව දෙස බලා හිස් තැනට ගැළපෙන වචනය ලියන්න. (ලකුණු 05යි)

ආදර්ශ පිළිතුරු

| | | |
|---|---|---|
| नरः | नरौ | नराः |
| देवः | **देवौ** | **देवाः** |
| सा | ते | **ताः** |
| **अजेन** | **अजाभ्याम्** | अजैः |

**(එක නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් දෙන්න.)**

(b) अलम्। आदाय। अमरणीय। पक्तुम्। नागरिक। මෙම වචන භාවිත කරමින් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න. (ලකුණු 05 යි)

ආදර්ශ පිළිතුරු

| कृदन्त | तुमन्त | तद्धित | निपात | पूर्वक्रिया |
|---|---|---|---|---|
| अमरणीय। | पक्तुम्। | नागरिक। | अलम्। | आदाय। |

**(එක නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් දෙන්න.)**

(c) පහත දැක්වෙන පදවල ඒකවචන රූප ලියන්න. (ලකුණු 05යි)

Write the singular form of the following words.

बालकैः .... लतासु ... वनानि ... गायथ ... अपठन् ....

ආදර්ශ පිළිතුරු

**बालकेन। लतायाम्। वनम्। गायसि। अपठत्।**

**(එක නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් දෙන්න.)**

(d) පහත දැක්වෙන පදවල **ශබ්ද මූලය** හෝ **ධාතු මූලය** ලියන්න. (ලකුණු 05යි)

Write the stem or root of the following words.

वयम्। ... पुस्तकालये। ... आगच्छति। ... चोरयति। ... लिखति। ...

ආදර්ශ පිළිතුරු

**अस्मद् पुस्तकालय आ +√गम् √चुर् √लिख्**

**(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් දෙන්න.)**

4. (a) පහත සඳහන් නාම වරනැගීම සම්පූර්ණ කරන්න. (ලකුණු 05යි)

Complete the following noun declensions. (05 marks)

ආදර්ශ පිළිතුරු

| | एकवचनम् | द्विवचनम् | बहुवचनम् |
|---|---|---|---|
| प्रथमा | **अयम्** | इमे | इमाः |
| द्वितीया | शालाम् | शाले | **शालाः** |
| चतुर्थी | गजाय | **गजाभ्याम्** | गजेभ्यः |
| पञ्चमी | **वानरात्** | वानराभ्याम् | **वानरेभ्यः** |
| सप्तमी | **पुष्पे** | पुष्पयोः | पुष्पेषु |

**(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් දෙන්න.)**

(b) පහත සඳහන් ආඛ්‍යාත වරනැගීම සම්පූර්ණ කරන්න. (ලකුණු 05යි)

Complete the following verb declensions. (05 marks)

ආදර්ශ පිළිතුරු

| | एकवचनम् | द्विवचनम् | बहुवचनम् |
|---|---|---|---|
| प्रथमपुरुष | **अवसत्** | अवसताम् | **अवसन्** |
| मध्यमपुरुष | विहरषि | **विहरथः** | विहरथ |
| उत्तमपुरुष | पठानि | **पठाव** | **पठाम** |

**(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් දෙන්න.)**

(c) වරහන් තුළ ඇති වචන සුදුසු පරිදි යොදා හිස් පුරවන්න. (ලකුණු 10යි)

Fill in the blanks with suitable words given in the brackets. (10 marks)

**(सूर्यस्य - चण्डः - तदा - यदा - पद्मानि - नाशयति - मृदु - सूर्यस्य - दिशि - अस्तं)**

ආදර්ශ පිළිතුරු

सूर्यः पूर्वस्यां **दिशि** उदेति। तस्मिन् समये **सूर्यस्य** प्रकाशः **मृदु** कोमलश्च भवति। तथापि सूर्योऽन्धकारं **नाशयति**। प्राणिनः प्रबोधयति। **पद्मानि** विकाशयति च। **यदा** सूर्यः नभसि मध्यम् आरोहति **तदा** मध्याह्नः इति वदन्ति। तदा सूर्यस्य प्रकाशः **चण्डः** भवति। ततः क्रमेण **अस्तं** गच्छति। अस्तं गच्छन् सूर्यः पुनः अपि मृदु कोमलश्च भवति। जीवितमपि **सूर्यस्य** समानमिति वदन्ति। **(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් දෙන්න.)**

5. (a) පහත ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (ලකුණු 10 යි)

Read the following passage and answer the questions given below. (10 marks)

अस्ति मगधदेशे चम्पकवती नामारण्यानी। तस्यां चिरान्महता स्नेहेन मृगकाकौ निवसतः। स च मृगः स्वेच्छया भ्राम्यन् हृष्टपुष्टाङ्गः केनचिच्छृगालेनावलोकितः। तं दृष्ट्वा शृगालोऽचिन्तयत् - आः, कथमेतन्मांसं सुललितं भक्षयामि। भवतु! विश्वासं तावदुत्पादयामि। इत्यालोच्योपसृत्याब्रवीत् – मित्र, कुशलं ते। मृगेणोक्तम्। कस्त्वम्। स ब्रूते - क्षुद्रबुद्धिर्नामा जम्बुकोऽहम्। अत्रारण्ये बन्धुहीनो मृतवदेकाकी वसामि। इदानीं त्वं मित्रमासाद्य पुनः सबन्धुर्जीवलोकं प्रविष्टोऽस्मि। अधुना तवानुचरेण मया सर्वथा भवितव्यम्। मृगेणोक्तम् - एवमस्तु। ततः पश्चादस्तं गते सवितरि भगवति मरीचिमालिनि तौ मृगस्य वासभूमिं गतौ। तत्र

चम्पकवृक्षशाखायां सुबुद्धिर्नामा काको मृगस्य चिरमित्रं निवसति। तौ दृष्ट्वा काकोऽवदत् - सखे चित्राङ्ग, कोऽयं द्वितीयः। मृगो ब्रूते - जम्बुकोऽयम्॥

i. පෘෂ්ටිමත් මුවා දුටු සිවලා කුමක් සිතුවේ ද?
ii. ඔබ කවුදැයි විමසුවේ කවු ද?
iii. ඉර බැස ගිය කල්හි මුවාගේ වාසභූමියට ගියෝ කවරහු ද?
iv. මුවාගේ නම කුමක් ද?
v. මුවාගේ මිතුරා කවුද?

ආදර්ශ පිළිතුරු

(i) 'आः, कथमेतन्मांसं सुललितं भक्षयामि। भवतु! विश्वासं तावदुत्पादयामि।

'ආහ් ලෙලදෙන මොහුගේ කෙසේ කම් ද හොදයි. පළමුව විශ්වාසය ඇති කරගනිමි.'

(ii) මුවා විසින් විමසන ලදි.
(iii) මුවා සහ සිවලා
(iv) චිත්‍රාඞ්ග
(v) සුබුද්ධි නම් කපුටා

(නිවැරදි පිළිතුරකට ලකුණු 02 බැගින් දෙන්න.)

(b) ඉහත ඡේදයේ දක්වෙන විසර්ග සන්ධි පද එකක්, ස්වර සන්ධි පද දෙකක් හා ව්‍යඤ්ජන සන්ධි පද දෙකක් තෝරා විසන්ධි කොට ලියන්න. (ලකුණු 05 යි)

Select one *visarga sandhis*, two *svara sandhi* and two *vyañjana sandhis* from the above passage and disjoin them. (05 marks)

ආදර්ශ පිළිතුරු

විසර්ග සන්ධි පද सः। कः त्वम्। क्षुद्रबुद्धिः नामा। जम्बुकः अहम्। शृगालः अचिन्तयत्

ස්වර සන්ධි පද नाम अरण्यानी। शृगालेन अवलोकितः। इति आलोच्य उपसृत्य अब्रवीत्। मृगेण उक्तम्।

ව්‍යඤ්ජන සන්ධි පද चिरात् महता। केनचित् शृगालेन। तावत् उत्पादयामि।

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් දෙන්න.)

(c) ඉහත ඡේදයෙන් ප්‍රථමා විභක්ති පද පහක් තෝරා ඒවායේ ශබ්ද ප්‍රකෘති ලියන්න. (ලකුණු 05 යි)

ආදර්ශ පිළිතුරු

ඉහත ඡේදයෙන් උපුටාගත් ප්‍රථමා විභක්ති පද පහක් ශබ්ද ප්‍රකෘතිය සමග ලියා තිබිය යුතු ය.

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් දෙන්න.)

06. (a) ශතක ග්‍රන්ථ තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

ආදර්ශ පිළිතුරු

ශතක ග්‍රන්ථ තුනක නම් ලියා තිබිය යුතු ය.

**(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් දෙන්න.)**

(b) උපදේශ ශ්ලෝකයක් ලියා එහි තේරුම ලියන්න. (ලකුණු 04යි)

..............................................................................................................

ආදර්ශ පිළිතුරු

උපදේශ ශ්ලෝකයක් ලියා එහි තේරුම ලියා තිබිය යුතු ය.

**(නිවැරදි ශ්ලෝකය ලකුණු 02යි. නිවැරදි තේරුමට ලකුණු 02යි.)**

(c) ශතක ග්‍රන්ථ පිළිබඳ කෙටි සටහනක් ලියන්න. (ලකුණු 05යි)

ආදර්ශ පිළිතුරු

..............................................................................................................

ශතක ග්‍රන්ථ පිළිබඳ කෙටි සටහනක් ලියා තිබිය යුතු ය.

**(අන්තර්ගතය සලකා බලා ලකුණු දෙන්න.)**


(d) මහාකවි කාලිදාස පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 08යි)

ආදර්ශ පිළිතුරු

මහාකවි කාලිදාසයන්ගේ කාලය, කවිත්වය රචනා කොට ඇති ග්‍රන්ථ උදාහරණ සහිත ව කරුණු ඉදිරිපත් කොට තිබිය යුතු ය.

**(අන්තර්ගය සලකා මණ්ඩලය තුළ ඇති කරගන්නා එකගතාවය මත ලකුණු දෙන්න.)**

07.




(a) චිත්‍රය ඇසුරෙන් වචන තුනකට නොඅඩු සංස්කෘත වාක්‍ය පහක් **දේවනාගරී** අකුරෙන් ලියන්න. (එක ම වචනය දෙවරකට වඩා භාවිත නො කළ යුතු ය.) (ලකුණු 10යි)

Write five sentences in Sanskrit using the ***Devanägaré*** Script, describing the picture given above. Each sentence should contain not less than three words. (One word should not be used more than twice.) (10 marks)

**ආදර්ශ පිළිතුරු**

චිත්‍රය ඇසුරෙන් වචන තුනකට නොඅඩු සංස්කෘත වාක්‍ය පහක් ලියා තිබිය යුතු ය. එය දේවනාගරී අක්ෂරයෙන් ලිවිය යුතු ය. එසේ නොවන අවස්ථාවල දී ලකුණු පහක් පමණක් දිය යුතු ය.

**(නිවැරදි පිළිතුරකට ලකුණු 02 බැගින් දෙන්න.)**

(b) පහත සඳහන් ශ්ලෝකය පද වෙන් කොට නැවත ලියන්න. (ලකුණු 05යි)

Rewrite the following verse putting each word separately. (05 marks)

**अरक्षितं तिष्ठति दैवरक्षितं सुरक्षितं दैवहतं विनश्यति ।**

**जीवत्यनाथोऽपि वने विसर्जितः कृतप्रयत्नोऽपि गृहे विनश्यति ॥**

**ආදර්ශ පිළිතුරු**

**अरक्षितं तिष्ठति दैवरक्षितं सुरक्षितं दैवहतं विनश्यति ।**

**जीवति अनाथः अपि वने विसर्जितः कृतप्रयत्नः अपि गृहे विनश्यति ॥**

**(නිවැරදි ව වෙන් කොට ඇති සලකා ලකුණු දෙන්න.)**

(c) ස්වර සන්ධිය හඳුන්වා උදාහරණ **හතරක්** ලියන්න. (ලකුණු 05යි)

**ආදර්ශ පිළිතුරු**

ස්වර සන්ධිය හඳුන්වා උදාහරණ හතරක් ලියා තිබිය යුතු ය.

**(ස්වර සන්ධිය හැඳින්වීමට ලකුණු 03යි. උදාහරණවලට ලකුණු 02යි.)**